*සැ. යු.*- 2012.05.11 දින පළ වූ අංක 1,758 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවීය.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,759 - 2012 මැයි 18 වැනි සිකුරාදා - 2012.05.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 384 |


*සැ. යු.* - (i) ද පේරන්ටස් පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2012 පෙබරවාරි මස 24 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) බුලත්සිංහල ජනශක්ති මහා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2012 පෙබරවාරි මස 24 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(iii) ශ්‍රී ලංකා පරිපාලන සංවර්ධන හා පර්යේෂණ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2012 මාර්තු මස 09 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා සියලු ම දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2012 මැයි මස 25 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2012 මැයි මස 11 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2012 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# විවිධ දැන්වීම්

## සිය සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කිරීම විෂයෙහිලා කොළඹ දී පවත්වනු ලබන බස්නාහිර පළාත්බද මහාධිකරණයේ දී ය.

ගණන් බේරා වසා දැමීමේ ඉල්ලුම්පත්‍ර අංකය : 02/2012/CO

කළුතර දකුණ, විජේසේකර පෙදෙස, අංක : 10 හි කාන්ති ප්‍රනාන්දු විසින් කොළඹ 08, කාසල් ටෙරස්, අංක : 1 හි ඩබ්ලිව් ලියෝ ප්‍රනාන්දු (මද්දගෙදර) වතුයාය සමාගම ගණන් බේරා වසා දැමීම පිළිබඳව පෙත්සමක් වර්ෂ 2012 ක් වූ ජනවාරි මස 23 වැනි දින කොළඹ දී පවත්වනු ලබන බස්නාහිර පළාත්බද මහාධිකරණයට ඉදිරිපත් කොට ඇති බවත්, පෙත්සම පිළිබඳව වර්ෂ 2012 ක් වූ මැයි මස 17 වැනි දින කැඳවීමට නියමකර ඇති බවත් දැනුම් දෙන අතර, එහිදී කරනු ලබන නියෝගයක් සම්බන්ධයෙන් පාක්ෂිකව හෝ විරුද්ධව කරුණු දැන්වීමට එම සමාගමේ ණයකරුවෙකු හෝ දායකත්වයක් දරන්නෙකු වෙන්ව කරුණු දැක්වීම පිණිස වර්ෂ 2012 ක් වූ මැයි මස 17 වැනි දින අධිකරණයේ පෙනී සිට කරුණු දැක්වීමට නියෝග කර ඇති අතර එසේ කිරීම පෞද්ගලිකව හෝ ලේඛනගත නීතිඥයෙකු මගින් කළ හැකිය. පෙත්සමේ පිටපතක් නියමිත ගාස්තු මත එහි ණයකරුවෙකු හෝ දායකයෙකුට පහත අත්සන් කරනු ලබන නීතිඥවරයාගෙන් ඉල්ලා සිටින විට ලබාගත හැකිය.

කේ. උපේන්ද්‍ර ගුණසේකර මහතා,
අංක 135-1/3,
ගුණසිංහපුර නීතිඥ කාර්යාල සංකීර්ණය,
ශාන්ත සෙබස්තියන් වීදිය,
කොළඹ 12.

*සටහන.*— මෙම පෙත්සම විමසීමට ගන්නා අවස්ථාවේ පෙනී සිටීමට බලාපොරොත්තු වන යම් කෙනෙක් ඇත්නම් ඉහත නම් සඳහන් නීති උපදේශක වන කේ. උපේන්ද්‍ර ගුණසේකර යන අයට එසේ කිරීමට කැමති බව ලිඛිතව දැන්විය යුතුය. එසේ කිරීමට බලාපොරොත්තු වන පුද්ගලයෙක් හෝ ව්‍යාපාරයක් හෝ ඔහුගේ එකී ව්‍යාපාරය වෙනුවෙන් ලේඛනගත නීති උපදේශකවරයෙක් වෙතොත් ඔවුන් විසින් ඔවුන්ගේ නම් සහ ලිපිනය ඇතුළත්ව අත්සන් තබා ඉහත සඳහන් නීතිඥවරයාට වර්ෂ 2012 ක් වූ මැයි මස 16 වැනි දින ප.ව. 4.00 ට හෝ ඊට පෙර ඉහත ලිපිනයට තැපෑලෙන් එවිය යුතුය. භාරදිය යුතු ය.

පෙත්සම්කරුගේ ලේඛනගත නීතිඥ.

05-385

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.